සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

# Second Term Test - Grade 9 - 2017

නම/විභාග අංකය:-.............................. චිත්‍ර කලාව කාලය:-පැය 03යි

## I පත්‍රය

I - පත්‍රය - පැය 01
II - පත්‍රය - පැය 02 } මුළු කාලය පැය 03කි.

සැලකිය යුතුයි:

- **සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**



01. මෙම ඡායාරූපයෙන් දැක්වෙන කැටයම ........................................................................................... නම් ස්ථානයෙන් උපුටා ගන්නා ලද නිර්මාණයකි.

02. මෙම කැටයම ......................................................................................... නමින් හැඳින්වේ.

03. සුප්‍රසිද්ධ කැටයම් සහිත මෙම ස්ථානය .................................................................................. යුගයේ රජකළ තුන්වන වික්‍රමබාහු රජ දවස ඉදිවිනැයි සැලකේ.

04. මෙහි සමස්ත නිර්මාණය සඳහා යොදා ගෙන ඇත්තේ ...................................................................................... මාධ්‍යයි.

05. මෙහි නිර්මාණ ශිල්පියා වන්නේ ...................................................................................... සහ ඔහුගේ අනුගාමික ශිල්පීන් බව සඳහන් වේ.

- **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

06. පාරම්පරික සැරසිලි කලාවේ මෝස්තර වර්ගීකරණයට අනුව ඉර සහ හඳ සංකේත අයත් වනුයේ කිනම් වර්ගයට ද? ......................................................................................

07. ලෝකඩ මාධ්‍යයෙන් හෝ පිත්තල මාධ්‍යයෙන් දේව ප්‍රතිමාවක් නිර්මාණය කිරීමේ දී වාත්තු කිරීමේ ශිල්ප ක්‍රමයක් ඒ සඳහා යොදාගත යුතුය. ඒ සඳහා යොදා ගනු ලබන වඩාත් සුදුසුම වාත්තු ක්‍රමය කුමක් ද? ..................................................

08. මැටි මාධ්‍යයෙන් භාණ්ඩ නිර්මාණයේදී යොදාගනු ලබන සුවිශේෂී උපකරණය හඳුන්වන නම කුමක්ද? ..................................................................

09. පාරම්පරික ලාක්ෂා නිර්මාණ ශිල්පීන් කහ වර්ණය සාදාගැනීමට භාවිතා කරනු ලැබුවේ කිනම් ද්‍රව්‍යයක් ද? ..........................................

10. රාජධානිය බිඳ වැටීමෙන් පසු කලක් වනගතව පැවති සීගිරිය පිළිබඳව පුළුල්ව ගවේෂණය කර එය මුල්වරට ලෝකයට අනාවරණය කරනු ලැබුවේ කවරෙකු විසින් ද? ....................................................................

I **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩා නිවැරදි පිළිතුර අදාළ කොටස තුළින් තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

11. ඉස්ලාම් ආගම හා සබැඳි සුවිශේෂී ගෘහ නිර්මාණ අංගයක් වන්නේ

(i) ගෝපුරම් (ii) හර්මිකාව (iii) ගෙඩිගේ (iv) කුම්බා

12. පනාවිටිය අම්බලමේ ලී කැටයම් ශිල්පියා යොදා ගෙන ඇත්තේ,

(i) වාටි මෝස්තරයි (ii) සත්ව රූප පමණි

(iii) මල් ලියකම්, සත්ව රූ හා ජන ජීවිතයයි (iv) ලියවැල් රටා මෝස්තර හා සත්ව රූපයි

13. සීගිරි සිතුවම් ප්‍රෙස්කෝ බුවනෝ ශිල්ප ක්‍රමයට සිතුවම් කර ඇති බවට පවතින මතය සඳහා ප්‍රබලතම සාක්ෂිය වන්නේ

(i) චිත්‍ර විශාල සංඛ්‍යාවක් ඉතිරිව තිබීම (ii) යොදා ඇති වර්ණවල දීප්තිමත් ස්වභාවය

(iii) සිතුවම් තුළ වැරදුන රේඛා ඉතිරිව තිබීම (iv) තරමක් ඝන බදාම ස්ථරයක් භාවිතා කර තිබීම

14. පොකුණු, වැව් වැනි ජලාශ්‍රිත ස්ථානයන් හි එහි ආරක්ෂාව පිණිස යොදාගෙන ඇති මුරගල් විශේෂය මින් කුමක් ද?


(i) බහිරව රූපය සහිත මුරගල (ii) නාග රුව සහිත මුරගල


(iii) පුන්කලස යෙදූ මුරගල (iv) නාරජ රුව සහිත මුරගල

15. ශ්‍රී ලංකාවේ පාරම්පරික වෙස් මුහුණු නිර්මාණයේ දී භාවිත කළ පියවරක් නොවන්නේ


(i) ගණ කැපීම (ii) මඩේ දැමීම (iii) කිරි හිඳවීම (iv) පායම් පෑහීම



I **අංක 16 සිට 20 දක්වා දී ඇති රූපසටහන්වලට සෘජු සබඳතාවක් දක්වන රූපසටහන ඉදිරියෙන් ඇති** A, B, C, D, E **යන රූප සටහන් අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

16.  (.........................)  A

17.  (.........................)  B

18.  (.........................)  C

19.  (.........................)  D

20.   E

I අංක 21 සිට 25 තෙක් දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

21. ශ්‍රී ලංකාවේ පාරම්පරික වෙස් මුහුණු නිෂ්පාදනයේ දී බහුල ලෙස ........................................ ලී භාවිත කෙරේ.


22. ........................................ මුද්‍රාවෙන් බුදුන් වහන්සේ බුද්ධත්වය ලබා ගැනීම පිළිබඳ මහී කාන්තාව සාක්ෂි දරණ බව නිරූපණය කෙරෙයි.

23. බුද්ධ ප්‍රතිමා නෙළීමේ දී හිටි පිළිම ඍජුකායෙන් හා ........................................ ඉරියව්වෙන් දක්නට ඇත.

24. අනුරාධපුරයේ සමාධි පිළිමය නිර්මාණයේ දී ........................................ කලා ලක්ෂණවල ආභාසය ලැබී ඇති බව විචාරක මතයයි.

25. පොළොන්නරුව ගල් විහාරයෙහි හිටි පිළිමයෙහි දැකිය හැකි දුර්ලභ මුද්‍රාව ........................................ නමින් හඳුන්වනු ලබයි.

I ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට P, Q, R, S, T යන රූප ඇසුරු කරගෙන නිවැරදි පිළිතුරු සපයන්න.



P Q R S T

26. P අක්ෂරයෙන් දැක්වෙන බුද්ධ ප්‍රතිමාව නිර්මාණයේ දී යොදාගත් ආසන ක්‍රමය හඳුන්වනු ලබන නම කුමක් ද?

........................................

27. Q අක්ෂරයෙන් දැක්වෙන සුප්‍රකට ලී කැටයම හමුවන ස්ථානය කුමක් ද?

........................................

28. R අක්ෂරයෙන් දැක්වෙන නිෂ්පාදනයන් පාරම්පරික කලා කර්මාන්තයකට අයත් වේ. එම කර්මාන්තය හඳුන්වනු ලබන නම කුමක් ද?

........................................

29. S අක්ෂරයෙන් දැක්වෙන බුද්ධ ප්‍රතිමාවෙහි මුද්‍රාවෙන් නිරූපණය කර ඇත්තේ කිනම් අවස්ථාවක් ද?

........................................

30. T අක්ෂරයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පාරම්පරික වෙස්මුහුණු කලාවේ දී නිර්මාණය වන සුප්‍රකට වෙස් මුහුණකි. මෙම වෙස් මුහුණු හඳුන්වනු ලබන නම කුමක් ද? ........................................

**l** **අංක 31 සිට 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වනසේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

31. අල්ලියාදු :- ..........................................................................................................

32. වලිච්චි :- ..........................................................................................................

33. ඉද්ද :- ..........................................................................................................

34. ත්‍රිභංග :- ..........................................................................................................

35. පට්ටල් වැඩ :- ..........................................................................................................

**l** **පහත දී ඇති ඡායාරූපය හඳුනාගෙන එහි දැක්වෙන කලා නිර්මාණයෙහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.**



36. මෙම ප්‍රතිමාව කුමක්ද? :- ..........................................................................................................

37. භාවිතා කළ මාධ්‍ය :- ..........................................................................................................

38. මෙම ප්‍රතිමාවෙන් දක්වා ඇති අවස්ථාව:- ..........................................................................................................

39. අයත් වන යුගය :- ..........................................................................................................

40. සුවිශේෂී ලක්ෂණ :- ..........................................................................................................

, l=Kq (1 5 40 = 40)

---

**චිත්‍ර කලාව II පත්‍රය** **පැය 02 යි.**

(01) **ඔබ ඉදිරියේ තබා ඇති පහත ද්‍රව්‍ය සම්පිණ්ඩනය හොඳින් නිරීක්ෂණය කර ත්‍රිමාණ ලක්ෂණ දක්වමින් රේඛා චිත්‍රයක් අඳින්න.**

සනකයක්/සනකාභ හැඩයක් සමග තැබූ ගෝලාකාර හැඩයක් (ලකුණු 20)

(02) පහත ''අ'' ''ආ'' ''ඇ'' කොටස් තුනේ සඳහන් මාතෘකාවලින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන චිත්‍රයක් අඳින්න.

<u>''අ'' කොටස චිත්‍ර සංරචනය</u>

1. වනයේ සැරිසරන සතුන්
2. ධීවරයෝ

<u>''ආ'' කොටස මෝස්තර චිත්‍ර</u>

3. සත්ව රූප ඇසුරින් තිර රෙද්දකට මෝස්තරයක්
4. ඔබ කැමති මලක් හා කොළයක් ඇසුරින් ව්‍යාප්ත මෝස්තරයක්

<u>''ඇ'' කොටස ග්‍රැෆික්</u>

5. සබන් දවටනයක් සඳහා සැලසුමක්
6. නිර්මාණාත්මක අක්ෂර හා චිත්‍ර ඇසුරින් කිසියම් භාණ්ඩයක් ප්‍රචාරණයට අත් පත්‍රිකාවක් සැලසුම් කරන්න.

(ලකුණු 40)

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 9 - 2017

### චිත්‍ර කලාව පිළිතුරු පත්‍රය

1. ඇම්බැක්කේ දේවාලය
2. මල්ලව පොරය
3. ගම්පොල
4. දැව/ලී
5. දෙල්මඩ මූලාචාර්ය ශිල්පියා
6. දිව්‍ය
7. ඉටි වාත්තු ක්‍රමය
8. සකපෝරුව
9. හිරියල්
10. එච්. සී. පී. බෙල් මහතා
11. (iv) කුම්බා
12. (iv) විසංගත වර්ණ
13. (iii) සිතුවම් තුළ වැරදුන රේඛා ඉතිරිව තිබීම
14. (i) බහිරව රූපය සහිත මුරගල
15. (ii) මඩේ දැමීම
16. C
17. E
18. D
19. A
20. B

21. කදුරු ලී
22. භූමි ස්පර්ශ මුද්‍රාව
23. ත්‍රිභංග
24. ඉන්දීය ගුප්ත
25. පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව
26. හද්‍රාසන ක්‍රමය
27. පනාවිටිය අම්බලම
28. දුම්බර පැදුරු/දුම්බර කලාල
29. බුදුන් වහන්සේ ධ්‍යානයට සමවැදී සිටින අයුරු
30. නාග රාක්ෂ
31. වෙස් මුහුණු වර්ණ ගැන්වීමට පෙර තවරනු ලබන සුදු පැහැති ආලේපය අල්ලියාදු නමින් හැඳින්වේ.
32. වෙස් මුහුණු වර්ණ ගැන්වීමෙන් පසු එහි දීප්තිමත් බව වැඩිකර ගැනීම සඳහා වලිච්චි ආලේප කරනු ලැබේ. දොරණ තෙල් දුම්මල සමඟ මිශ්‍රකර එය සාදාගනු ලබයි.
33. දුම්බර පැදුරු කර්මාන්තයේ දී නියඳ කෙඳි විවීමේදී භාවිතා කරනු ලබන උපකරණයකි.
34. දණ, ඉණ, ගෙල යන තුන් ස්ථානයෙන් නැමුණු ආකාරය දැක්වෙන ඉරියව්ව. පොළොන්නරු යුගයේ නිර්මාණය වූ හිටි පිළිමවල බහුලව දැකිය හැකි ඉරියව්වකි. (පොලොන්නරුව ගල් විහාරයේ හිටි පිළිමය, පොත්ගුල් විහාර ප්‍රතිමාව)
35. ලාක්ෂා කර්මාන්තයේ දී පට්ටලය ආධාරයෙන් භාණ්ඩ අලංකාර කිරීමේ ශිල්ප ක්‍රමය මේ නමින් හැඳින්වේ.
36. ඉන්දියාවේ සාරානාත් බුද්ධ ප්‍රතිමාව/සාරානාත් පිළිමය
37. චූනාර් වැලි ගල් විශේෂය
38. බරණැස මිගදායේ බුදුන් වහන්සේ පස්වග තවුසන්ට ප්‍රථම ධර්ම දේශනාව (දම්සක් පැවතුම් සූත්‍රය) පවත්වන ආකාරය
39. ඉන්දීය ගුප්ත යුගය
40. අලංකාර ප්‍රභා මණ්ඩලයක් දක්වා තිබීම, උෂ්නීෂය අක්බමරු වන් හිසකෙස්, අඩවන් දෙනෙත් ලඹ සවන්, මද සිනහව තුළින් ප්‍රතිමාවේ මහා පෞරුෂය ඉස්මතු කර තිබීම
   මුහුණින් උපශාන්ත බව හා මහා කරුණාව නිරූපණය කර තිබීම
   පද්මාසන ක්‍රමයෙන් ධර්මචක්‍ර මුද්‍රාවෙන් ප්‍රතිමාව නිර්මාණය කර තිබීම
   දෙවුර වසාගත් චීවරය ඇඟට ඇලුණු ස්වභාවයෙන් නිරූපණය කර තිබීම (ලකුණු 40)

| | | |
|---|---|---|
| I පත්‍රය පිළිතුරු 1කට 01 ලකුණ බැගින් | 01 x 40 | = ලකුණු 40 |
| II පත්‍රය 01 කොටස සඳහා | | = ලකුණු 20 |
| 02 කොටස සඳහා | | = ලකුණු 40 |
| මුළු ලකුණු | | = ලකුණු 100 |

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

# Second Term Test - Grade 9 - 2017

## චිත්‍ර කලාව II සඳහා විශේෂ උපදෙස්

- 8 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අවසන් පිටුවෙහි දී ඇති උපදෙස් පරිදි 9 ශ්‍රේණියට ද්‍රව්‍ය බලා ඇඳීමේ රේඛාමය චිත්‍රයක් ඇතුළත් කර ඇත.
- ඒ සඳහා කාලය පැය 1/2ක් වෙන් කර ඇත. (8 ශ්‍රේණියෙහි උපදෙස් අනුව)
- එම කාලය පැය 1/2 වෙන් කර ඇත්තේ **II** පත්‍රයෙහිම අනිවාර්ය ප්‍රශ්නයක් ලෙසයි.
- ඝනකය හෝ ඝනකාභය
  ගෝලාකාර හැඩය (සපයා ගන්න)